**ශීර්ෂය - 269 මඩකලපුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය**

**2014 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව**

**--------------------------------------------------------------------------------**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/ **කච්චේරියේ**
ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

**--------------------------------------------------------------------------------**

(අ) කෝරලෙයි පත්තු උතුර

(ආ) කෝරලෙයි පත්තු බටහිර

(ඇ) කෝරලෙයි පත්තු මධ්‍යම

(ඈ) කෝරලෙයි පත්තු

(ඉ) කෝරලෙයි පත්තු දකුණ

(ඊ) එරාවූර්පත්තු

(උ) එරාවූර් ටවුන්

(ඌ) මන්මුනෙයි උතුර

(එ) කාත්තන්කුඩි

(ඒ) මන්මුනෙයි පත්තු

(ඔ) මන්මුනෙයි දකුණ හා එරුවිල් පත්තු

(ඕ) පොරතිවු පත්තු

(ක) මන්මුනෙයි නිරිත

(ග) මන්මුනෙයි බටහිර

**1.3 විගණන විෂය පථය**

**-----------------------**

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 03 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්රකාශන පිළිබඳ විගණන

නිරික්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට, අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම්

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.674,910,000ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.673,787,966ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.1,122,034 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.17 ක් නියෝජනය විය. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 443,334,774 | 442,239,972 | 1,094,802 | 3.0 |
| මූලධන | 231,575,226 | 231,547,994 | 27,232 | 4.5 |
| එකතුව | 674,910,000 | 673,787,966 | 1,122,034 | 0.17 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 24 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් පිළිවෙලින් රු.2,798,201,744 ක් හා රු.2,290,801,197 ක් වශයෙන් රු.5,089,002,941 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.2,737,335,334 ක් හා රු.1,867,173,959 ක් වශයෙන් එකතුව රු.4,604,509,293 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.60,866,410 ක් හා රු.423,627,238 ක් වශයෙන් එකතුව රු.484,493,648ක් හෙවත් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 2 ක් හා සියයට 18 කින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

**රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 26901 | 35,000,000 | 32,255,950 | 18,000,000 | 21,680,691 | 100,000,000 | 91,132,735 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

**----------------------------**

2014 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් ගිණුම්වල ශේෂය රු.123,576,581ක් විය.

**2.1 විගණන නිරීක්ෂණය**

**----------------------**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය - 269 මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය**

**---------------------------------------------------------------------------**

3.1 අයවැය විචලනය

--------------------

වැය විෂයයන් දෙකක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 සිට සියයට 07 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

3.2 **පොදු තැන්පත් ගිණුම්**

**--------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදී තිබුණු, එකතුව රු. 9,697,969 ක මුදල් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ආ) වර්ෂ 03කට වැඩි කාලයක සිට පැවතුණු එකතුව රු.565,263 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර පොත්වල දැක්වෙන ශේෂය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පොත් වල දැක්වෙන ශේෂය අතර තැන්පතු ගිණුමේ රු.563,837 ක වෙනසක් තිබුණද, මෙම වෙනස නිරවුල් කිරීම සඳහා 1983 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදි අනාවරණය වූ අඩුපාඩු පහතින් දැක්වේ.

**(අ)** **<u>නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්.</u>**

(i) වර්ෂ එකේ සිට පහක් දක්වා වූ කාල පරිච්ඡේදයක් මෝටර් වාහන 08ක් සහ යන්ත්‍රෝපකරණ 08ක් නිෂ්කාර්යව පැවතුණු බව නියැදි විගණන පරීක්ෂාවේදි අනාවරණය විය.

(ii) 2006 මාර්තු 21 දිනැති අංක එච් ඒ / ඩී ඒ / 12/ 27 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ගේ ලිපියට අනුව, සියළු ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් ඔවුන්ට වෙන් කරන ලද නිල නිවාසවල පදිංචි විය යුතුය. කෙසේ වුවද ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා ඉදිකරන ලද රජයේ නිල නිවාස 14 කින්, නිල නිවාස 11ක් අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(iii) "Lanka Government Network" ස්ථාපිත කිරීම සඳහා 2013 වර්ෂය තුළදී කෝරළේ පත්තු බටහිර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට උපකරණ කට්ටල දෙකක් (LGN) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන නියෝජිතායතනය විසින් සපයා තිබුණි. කෙසේ වුවද එවැනි ජාලයක් ස්ථාපිත කිරිමෙන් තොරව එම උපකරණ වර්ෂයකට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(iv) කාය වර්ධන පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.9,040,462 ක් වැයකර දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් හා උපකරණ මිලදී ගැනීම් සිදුකර තිබුණි. කෙසේ වෙතත්, 2015 ජුලි මාසය වනවිටත් අදාල අරමුණු සඳහා ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණි.

## 3.4 අනුකූල නොවීම්

---

**නීති, රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම්.**

විගණන නියැදි පරික්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති, හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (අ) මුදල් රෙගුලාසි 187 | 265,349 | පෝරතීව්පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුදල් ලැබීම් දෛනිකව බැංකුවේ තැන්පත් කර නොතිබුණු අතර, රැස් කරනු ලැබු මුදල් දින 02 සිට දින 06 ක් දක්වා වූ කාල ප්‍රමාදයකින් පසුව බැංකුවේ තැන්පත් කර තිබු බව නිරීක්ෂණය විය. |
| (ආ) මුදල් රෙගුලාසි 373 | 2,919,800 | දෙසැම්බර් 31 දිනට වූ අතැති අග්‍රිම ශේෂය එදිනම භාණ්ඩාගාරයට භාරදිය යුතුය. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනට වූ රු.2,919,800 ක අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයට භාරදීම සිදුකර තිබුණේ 2015 මාර්තු 06 වැනි දිනය. |

## 3.5 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---

විගණන නියැදි පරික්ෂණවලදී අනාවරණය වූ ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් පිළිබඳ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්

මහිලාදිතිවු දකුණ හින්දු කෝවිල් සමිතියේ පිළිගැනීමේ පුවරුව ඉදිකිරීම සඳහා මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.96,995 ක මුදලකට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, අදාල අධිකාරීන්වල අනුමැතීන් නොලැබීම මත 2015 ජූලි 31 දින වන විටත් ඉහත වැඩ කටයුතු අරඹා නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(i) කුමරන් කෝවිල් මාර්ගය ඉදිකිරීම

මන්මුනෙයි උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් කුමරන් කෝවිල් මාර්ගයේ කළුගල් ඇතිරීම හා තාර දැමීම සඳහා වටිනාකම රු.2,119,909 ක කොන්ත්‍රාත්තුවකට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මාර්ගය මතුපිට ක් කිහිපයක, 0+146-155 සහ 0+192+0+201 යන ස්ථානවල වලවල් හැරි තිබුණි.
- මාර්ගය අයිනේ ස්ථාන කිහිපයක හානි වී තිබුණි.
- වගකීම් කාලය 2014 නොවැම්බර් 22 දින අවසන් වුවත් ඉහත සඳහන් අඩුපාඩු 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිසි පරිදි සකස් කර නොතිබුණි.

(ii) වේලම්කුදා මාර්ගය ඉදිකිරීම

මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වේලම්කුදා මාර්ගයේ පිල්ලෙයියාරඩිවල කළුගල් ඇතිරීම හා තාර දැමීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු.5,468,099ක මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මාර්ගය මතුපිට ස්ථාන කිහිපයක වලවල් හැරි තිබුණි
- ස්ථාන කිහිපයක එනම් 0+154-0+263, 0+273+0+338, 0+351-0+378, 0+389-0+390, 0+396-0+403, 0+414-0+417, 0+426-0+433, 0+441-0+451 සහ 0+484-0+504 හි පදනම් සකස් කිරීම අසාර්ථකවී ඇති බව නිරීක්ෂණය විය.

- වගකීම් කාලය 2014 ජූලි 21 දින අවසන් වුවද ඉහත සඳහන් අඩුපාඩු 2014 දෙසැම්බර් 31 දින වන විටත් හඳුනාගෙන සකස් කර නොතිබුණි.

3.6 අනාර්ථික ගනුදෙනු
-----------------------
නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළැඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

2014 - මූල්‍ය කාර්ය වැඩසටහන
------------------------------------

(අ) වාකරෙයි ගොවිජන සංවර්ධන මණ්ඩල ප්‍රදේශයේ තෝනිතන්ඩමාදුකුලම් වැව අළුත්වැඩියා කිරීම
------------------------------------------------------------------------------------------

වාරි මාර්ග දෙපාර්තමේන්තු වෙන්කල්ලාඩි පළාත් කාර්යාලය විසින් වාකරෙයිහි පිහිටි තෝනිතන්ඩමාදුකුලම් වැව 2011 වර්ෂයේදී රු.4,763,000 ක් වැයකොට අළුත්වැඩියා කරන ලදි. කෙසේ වුවද, අළුත්වැඩියා කොට සම්පූර්ණ කරන ලද මෙම වැව කෝරලෙයිපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මීට පෙර සිදුකරන ලද අළුත්වැඩියාවන් සැලකිල්ලට නොගෙන රු.9,869,469 ක් වැය කොට නැවත වරක් අළුත්වැඩියා කරන ලදි. මේ අනුව ඉහත වැව සඳහා කෝරලෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දරන ලද රු.9,869,469 ක මුදල නිෂ්ඵල වියදමක් විය.

(ආ) තන්දමලෙයි ප්‍රදේශයේ පිහිටි මීනාච්චිඕඩෙයි වැව අළුත්වැඩියා කිරීම-2014
-------------------------------------------------------------------------------

මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ මුදල් කාර්ය වැඩසටහන යටතේ වැව් 05ක් අළුත්වැඩිය කිරීම සඳහා තෝරගෙන තිබුණි.කෙසේ වුවද, මීනාච්චිඕඩෙයිකුලම් නමින් හැඳින්වෙන තන්දමලෙයිහි පිහිටි වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මේ සඳහා තෝරා ගෙන නොතිබුණද එය අළුත්වැඩියා කර තිබුණි. පසුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 110,850ක් වැය කර අර්ධ වශයෙන් කරතිබූ ඉහත අළුත්වැඩියා කටයුතු අතරමග නවතා දැමීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, ඉහත සඳහන් අවිධිමත් ගෙවීම් සඳහා නිර්දේශ හා ලබාදුන් නිලධාරියාට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙන නොතිබුණි.

3.7 වැඩිපුර ගෙවීම්

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වාහරෙයි ගොවිජන මණ්ඩල බල ප්‍ර දේශයේ පිහිටි තෝනිතන්දමාඩු වැව නවීකරණයට ඝනමීටර් 16,187ක පස් පිරවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුයුක්ත කාර්මික නිලධාරියාගේ සහතික කිරීම මත රු.7,543,281ක් ප්‍රා දේශීය ලේකම් කෝරලෙයිපත්තු උතුර විසින් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, මඩකලපුව වාරි මාර්ග අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය පරිදි වැව් බැම්ම සඳහා ඝන මීටර් 7,171ක පස් පමණක් පස්පුරවා ඇති බව විගණනයේදි තහවුරු විය. මේ අනුව, නොකරන ලද කාර්යයක් වෙනුවෙන් රු.4,201,493ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

**3.8 කළමනාකරණ දූර්වලතා**

-----------------------------

**(අ) ඔප්පු භාරදීමේ ප්‍රමාදයන්**

**-----------------------------**

ඉඩම් සම්බන්ධයෙන් පැන නගින ලද ආරවුල් විසඳීම් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එක් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල පවත්වන ලද ජංගම සේවයන්ට අනුව, ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ හයක ප්‍රතිලාභින් 344 ක් සඳහා ස්වර්ණභූමි හා ජයභූමි ඔප්පු ප්‍රදානය කිරිමට තීරණය කර තිබුණි.එම ඔප්පු 1997 සිට 2014 කාල පරිච්ඡේදය තුළ අනුමත කර අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ආපසු එවා ඇති බව තවදුරටත් නිරික්ෂණය විය. කෙසේ වුවද ප්‍රතිලාභින් සඳහා මෙම ඔප්පු භාරදීමට 2015 ජූනි16 විගණන පරික්ෂණ දිනය දක්වා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නම | ප්‍රතිලාභීන් සඳහා නිකුත් නොකරන ලද ඔප්පු සංඛ්‍යාව |
|---|---|
| කාන්තන් කුඩි | 29 |
| කෝරළෙයි පත්තු බටහිර | 12 |
| මන්මුනෙයි උතුර | 08 |
| මන්මුනෙයි නිරිත | 25 |
| මන්මුනෙයි බටහිර | 38 |
| ඒරාවූර් පත්තු | 232 |
| එකතුව | 344 |

(ආ) <u>පුරාවස්තු අයිතමයන්ගේ අඩුවීම</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අළුත්වැඩියා කරන ලද කාත්තන්කුඩි කෞතුකාගාරයේ තැබීම පිණිස වටිනාකම රු.581,100 ක් වූ පුරාවස්තු අයිතමයන් 05 ක් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලදි. කෙසේ වුවද, විගණන පරීක්ෂණ දිනය වූ 2015 ජුනි 12 දින වන විටත් මෙම අයිතමයන් කෞතුකාගාරයට ලැබී නොතිබුණි.

(ඇ) <u>රජයේ නිල නිවාසවල පදිංචි වීම</u>

මඩකලපුව, ග්‍රීන් පාරේ පිහිටි රජයේ නිල නිවාසවල අනවසරයෙන් පුද්ගලයින් දෙදෙනෙකු 2010 වර්ෂයේ සිට පදිංචිව සිටී.කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා කළමනාකරණය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) <u>සන්නිවේදන කුළුණු සිටුවීම</u>

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 කට අයත් ඉඩම්වල පුද්ගලික සන්නිවේදන සමාගම් 06 ක් විසින් අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව ඔවුන්ගේ සන්නිවේදන කුළුණු සිටුවා ගෙන තිබුණි. කෙසේ වුවද, මෙම සමාගම් වලට විරුද්ධව 2014 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

--------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 49 | 38 | 11 |
| තෘතියික මට්ටම | 34 | 06 | 28 |
| ද්විතියික මට්ටම | 556 | 519 | 37 |
| ප්‍රාථමික මට්ටම | 137 | 126 | 11 |
| එකතුව | 776 | 689 | 87 |